මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 - 2023

---

1. විගණන මතය

1.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17ට අදාළව 2023 වර්ෂයේ නිකුත් කර තිබුණු විගණන වාර්තා 17 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණ අතර, ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 17කට අදාල ඉඩම්, කාර්යාල ගොඩනැගිලි, පොහොර ගබඩා සහ විකුණුම් මධ්‍යස්ථාන ආදියෙහි වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	වත්කම් පවරාගෙන සියළු මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම තක්සේරු කිරිමට පියවර ගනු ලබන බව.	ඉඩම්, ගොඩනැගිලි හා අනෙකුත් වත්කම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගතයුතුය.
(ආ)	ආයිත්තමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ පවතින පරිගනක පද්ධති 03ක්, තණකොල කැපීමේ යන්ත්‍ර 04ක්, තෙල් ඉසිනයන් 03ක්, පැල සිටුවීමේ යන්ත්‍ර 04ක්, වී ඉවත්කිරීම් (ඍජු වී සීඩර්) 04ක්, උඳු පියලි ඉවත්කිරීම් උපකරණ 01ක්, ඩෝසර් යන්ත්‍ර 01ක් සහ ඡායා පිටපත් යන්ත්‍ර ආදියෙහි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරියේදී වටිනාකම් අනාවරණය කිරීමට පියවර ගනු ලබන බව.	දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගතයුතු ය.
(ඇ)	ආයිත්තමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ රෝද දෙකේ ට්‍රැක්ටරය විකුණුම් වටිනාකම රු.542,134ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ට්‍රැක්ටර අත්තිකාරම් මුදල් අයකර කොමසාරිස්වරයාට යවනු ලැබේ. ඉදිරියේදී ලේඛනගත කිරීමට පියවර ගනු ලබන බව.	අදාළ විකුණුම් වටිනාකම ගිණුම්වල ගලපා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

(ඇ)	වාකරෙයි ගොවිජන සේවා කාරක සභාවේ පැවැති පරිගනක පද්ධති 01ක්, ඩෝසර් 01ක්, තණකොල කැපීමේ යන්ත්‍ර 11ක්, ඡායා පිටපත් යන්ත්‍ර 01ක්, තෙල් ඉසිනයන් 04ක්, කෘමිනාශක ඉසිනයන් 03ක්, විදුලි තෙල් ඉසිනයන් 32ක්, පරිගනක මොනිටර් 02ක්, යූපීඑස් 02ක්, මාලිමා 01ක්, වයිෆයි රවුටර 01ක්, යකඩ සේප්පු 01ක්, අගුල් (ඉබ්බා) 01ක් සහ ගොවිජන බැංකු කවුන්ටර 01ක් ආදියෙහි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2024 වර්ෂ කාලපරිච්ඡේදයේ එක් කිරීමට කටයුතු කෙරෙන බව.	දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගතයුතු ය.
(ඉ)	මන්ඩපත්තඩි සේවා සංවර්ධන කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස ස්ථාවර තැන්පතු 08ක පොලී රු.529,824ක් ගිණුම්ගත කර තිබු නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම් ලෙස රු.1,113,650ක් ගිණුම්ගත කර තිබුණි. මෙමගින් රු.583,826ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.	නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය.
(ඊ)	කොක්කඩි චෝලෙයි ගොවිජන සේවා කාරක සභාවේ මධ්‍යස්ථානයේ ට්‍රැක්ටරය, තෙල් ඉසින මෙවලම්, වතුර මෝටරය, ලීබඩු, කැමරා, දුරකථන සහ විදුලි පංකා ඇතුළු යන්ත්‍රෝපකරණ 07ක් මුළුමනින්ම ක්ෂය කර අවසන්ව පැවැති නමුත් එම වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවැති අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂයේ තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරන බව.	දේපළ, පිරියත හා උපකරණවල සාධාරණ අගය ගිණුම්ගත කිරීමට පියවර ගතයුතු ය.
(උ)	කොක්කඩි චෝලෙයි ගොවිජන සේවා කාරක සභාවට ලැබුණ ප්‍රදාන යටතේ සම්පූර්ණ කළ රු. 4,167,525ක් වූ ගොඩනැගිල්ල සහ රු.412,000ක් වූ ගෙවතු ප්‍රාග්ධනිත කර වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි.	නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව.	එම වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය.

(ඌ)	කරඩියනාරු ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල අක්කර බදු ආදායම් රු.1,651,040ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.1,508,058ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ අක්කර බදු ආදායම රු.142,982කින් අඩුවෙන් දක්වා තිබුණි.	අක්කර බදු මුදලින් ලැබීම් ගිණුම්ගත කර වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව.	පරීක්ෂා කර බලා නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට පියවර ගතයුතුය.
(එ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවේ ප්‍රමිති පාලන පර්යේෂණාගාර ආදායමින් පසුගිය වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන්ට ගෙවූ රු.420,495ක දිරිදීමනා, මුදල් පදනමින් ආදායම් ප්‍රකාශයේ දැක්වීමෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ගැලපීමට පියවර ගෙන ඇති බව.	ගිණුම්වල නිවැරදිව ගැලපීමට පියවර ගතයුතුය.
(ඒ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවේ පිරිවැය රු.3,067,900ක් වූ ප්‍රමිති පාලන පර්යේෂණාගාර උපකරණවල සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය නොකිරීමෙන් ශුද්ධ අතිරික්තය රු.306,790කින් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි කාලයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව.	ක්ෂය වටිනාකම ගිණුම්ගත කර නිසි පරිදි ගැලපීම් කළ යුතුය
(ඔ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල ගොඩනැගිලි 04ක දේපළ බදු රු. 9,896ක් සහ ගෙවිය යුතු දේපළ බදු රු.203,906ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරි කාලයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව.	එම ශේෂ ගිණුම්ගත කිරීමට පියවර ගතයුතුය.
(ඕ)	තාන්දාමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ පසුගිය සමයේ පැවැති යුද්ධයෙන් වත්කම් සහ උපකරණවලට සිදුවූ හානිය ජංගම නොවන වත්කම් යටතේ පිළිවෙලින් රු.1,834,050ක් සහ රු.252,862ක් වශයෙන් එකතුව රු.2,086,912ක් දැක්වීමෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නියමිත ක්‍රියාමාර්ග ගනු ලබන බව.	විධිමත් පරිදි කටයුතු කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට පියවර ගතයුතුය.
(ක)	තාන්දාමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ, කෘෂි රක්ෂණ	ඉදිරි කාලයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව.	අදාළ ආදායම් වටිනාකම ගිණුම්ගත

	මණ්ඩල ආදායම් රු.2,165,287ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි.		කිරීමට පියවර ගතයුතුය.
(ග)	ඒරාවූර් ගොවිජන සේවා කාරක සභාවට පසුගිය වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලැබූ කාර්යාල ලීබඩු අයිතම 82ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි.	ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස අනාවරණය කිරීමට පියවර ගනු ලබන බව.	වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට පියවර ගතයුතුය.
(ඝ)	2008 වර්ෂයේ ඇතිවූ කෝලාහලවලින් හානියට පත්වූ ඒරාවූර් ගොවිජන සේවා කාරක සභාවේ මධ්‍යස්ථානයට අයත් රු.459,562ක ජංගම නොවන වත්කම් 66ක් සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිලි කර තිබූ නමුත් ඒ පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ග ගෙන කපාහැරීමේ කටයුතු සිදුකර නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂවල නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා කපා හැරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය
(ට)	කාත්තාන්කුඩි ගොවිජන සේවා කාරක සභාව විසින් ඉඩම් කොටසක් බදු දීමෙන් බදුකරුගෙන් ලැබිය යුතු රු.105,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරි කාලයේදී හෙළිදරව් කිරීමට පියවර ගනු ලබන බව.	ලැබිය යුතු මුදල ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඩ)	වාලච්චේන ගොවිජන සේවා කාරක සභාවට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් රූපවාහිනි යන්ත්‍රය, වායුපීඩන වතුර මෝටරය, ෆයිබර් ග්ලාස් යන්ත්‍රය (Fiber Glass Machine), තණකොල කැපීමේ යන්ත්‍රය (Chopping Machine) සහ කැලි කිරිමේ යන්ත්‍රය සහ ඇඹරුම් යන්ත්‍ර (Shread Machine) ආදියෙහි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	මේවා නැවත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ආපසු ලබාදිමට සිදුවිය හැකි බැවින්, මෙහි වටිනාකම් අපගේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු බව.	වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගතයුතුය.

1.3.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාත්තාන්කුඩි ගොවිජන සේවා කාරක සභාව විසින් විධිමත් අනුමැතියකින් තොරව රැස්කළ මූල්‍ය බදුකුලි සෑම වර්ෂයක එහි මූල්‍ය ප්‍රකාශනවල ආදායමක් ලෙස දක්වා තිබුණ අතර, එම ආදායම් කාරක සභාවේ වියදම් සඳහා උපයෝජනය කර තිබුණි. තවද, එකතුව රු. මිලියන 1.5ක මුදලක් ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් අවස්ථා 06කදී ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු යටතේ තැන්පත් කර තිබුණ අතර, ඊට අදාල පොලිය කාරක සභාවේ ජංගම ගිණුමට මාරුකර වියදම් පියවීමට උපයෝගි කර තිබුණි.	රජයේ ඉඩම් ආඥා පනතට අනුව මෙම මුදල් උපයෝජනය කිරීමට පියවර ගනු ලබන බව.	රජයේ ඉඩම් ආඥා පනතට අනුව මෙම මුදල් උපයෝජනය කිරීමට පියවර ගතයුතුය.
(ආ)	රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධානවලට අනුව පළුගාමම් ගොවිජන සේවා කාරක සභාවට පවරා නොදුන් අක්කර 0.6514ක රජයේ ඉඩම, ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් පුද්ගලයින් දෙදෙනෙකුට මාසික බදුකුලි පදනමින් වර්ෂ 30කට රජයේ ඉඩම් ආඥා පනතට අනුකූලව බදු දීමෙන් ගොවිජන සංවර්ධන කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ රු.60,000ක නීතියට පටහැනි ආදායමක් උපයා තිබුණි.	නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ අනුමැතිය සහිතව මෙම ඉඩම් බදු දී තිබූ බව.	රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධානවලට අනුව පියවර ගතයුතුය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 09ක ගොවි සංවිධානවලට ලබාදුන් රෝද දෙකේ ට්‍රැක්ටර් සහ උපකරණවලට අදාල රු.4,985,434ක හිඟමුදල් අයකර ගැනීමට හෝ වත්කම් නැවත පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	හිඟ මුදල් අයකර ගැනීමට හෝ වත්කම් ආපසු පවරා ගැනීමට පියවර ගතයුතුය.

(ආ)	ආයිත්තමලෙයි, ඒරාවූර් හා කොක්කඩිචෝලෙයි ගොවිජන සේවා කාරක සභාවල එකතුව රු.2,150,065 ක ගෙවිය යුතු ශේෂ දීර්ඝ කාලයක සිට ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.	ගිණුම් ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන ඇති බව.	බැරකම් පියවීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය.
(ඇ)	තිරසාර කෘෂි කළමනාකරණ සැලැස්ම යටතේ කල්අඩි ගොවිජන සේවා කාරක සභාවට කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේ ලබා දුන් සූර්ය බලයෙන් ක්‍රියාකරන වතුර මෝටර වාරික පදනමින් ගොවීන්ට ලබාදී වසර 11 ක් ගත වී ඇතත්, ඔවුන්ගෙන් ලැබිය යුතු රු.9,673,779ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය.
(ඈ)	කිරාන් ගොවිජන සේවා කාරක සභාව විසින් දීර්ඝ කාලයක සිට ජංගම නොවන බැරකම් යටතේ දක්වා ඇති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ට්‍රැක්ටර් 06ක් සහ කෘෂි උපකරණ සඳහා වූ රු.755,000ක ශේෂය ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.	ට්‍රැක්ටර්වල වාරික මුදල් දීර්ඝ කාලයක සිට නොගෙවා තිබූ බැවින් ඒවා පවරා ගැනීමට හෝ කපා හැරීමට පියවර ගන්නා ලෙසට දිස්ත්‍රික් කාර්යාලයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව.	ට්‍රැක්ටර්වල වාරික මුදල් අයකිරීමට/පවරා ගැනීමට හෝ විධිමත් අනුමැතිය යටතේ කපාහැරීමට පියවර ගතයුතුය
(ඉ)	ගොවිජන සේවා කාරක සභා 4 ක වර්ෂ කීපයක සිට ඉදිරියට එන අය නොවී පවතින රු.2,828,118 ක හිඟ ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය කර ගෙන නොතිබුණි.	අයකර ගැනීමට පියවර ගන්නා බව	හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය.
(ඊ)	කිරාන් ගොවිජන සේවා කාරක සභාව විසින් "අස්වැන්නෙන් පසු සම්පූර්ණයෙන් නිරවුල් කළයුතුය" යන කොන්දේසිය මත පසුගිය වර්ෂවල මධ්‍යස්ථානය විසින් ගොවීන් 84 කට ලබාදුන් රසායක ද්‍රව්‍ය, පොහොර සහනාධාර ණය, මිල අධික පොහොර ණය , වී බීජ ණය සහ ද්‍රාවණික කාබනික පොහොර ණයවලින් අයකර ගතයුතු එකතුව රු.3,203,995 ක් අයකර ගැනිමට පියවර ගෙන නොතිබුණ අතර, ලබාදුන් ණය වෙනුවෙන් ණය ලෙජරද පවත්වා නොතිබුණි.	මුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය.

(ල)	කොක්කඩි චෝලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් 2022 වර්ෂයේ ගොවි සංවිධානවලට ලබාදුන් කෘෂි රසායන සහ කෘෂි යෙදවුම් වෙනුවෙන් ලැබිය යුතු රු.312,950 ක් හා 2019 වර්ෂයේ ගොවි සංවිධාන 06කට ලබාදුන් පොහොර ණය රු.320,000 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය.
(ළු)	කොක්කඩි චෝලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවි සංවිධාන දෙකකින් අයකර ගතයුතු කෘෂි රසායන ණය රු. 246,825 ක් මධ්‍යස්ථානයේ සේවය කළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණද, එම මුදල් සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	හිඟ මුදල් අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතුයි.
(එ)	ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් ට්‍රැක්ටර් සහ කෘෂි උපකරණවල වාරික මුදල් ලෙස රු. 1,477,134 ක් අදාළ පාර්ශ්ව වෙත ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී ගෙවා නිරවුල් කිරීමට පියවර ගනු ලබන බව.	නියමිත කාලය තුළ බැරකම් ගෙවා නිරවුල් කිරීමට පියවර ගතයුතුය.
(ඒ)	කරඩියනාරු ගොවිජන සේවා කාරක සභාව විසින් යූරියා පොහොර විකුණුම්වලින් ලැබූ රු. 1,742,000 ක් ජාතික පොහොර ලේකම් කාර්යාලයට ගෙවා නිරවුල් කිරීමට පසුගිය වර්ෂ 03 කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි.	ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ඉල්ලීම් කළහොත් එම මුදල් ලබාදීමට පියවර ගනු ලබන බව.	නියමිත කාලය තුළ බැරකම් ගෙවා නිරවුල් කිරීමට පියවර ගතයුතුය.
(ඔ)	පළුගාමම් ගොවිජන සේවා කාරක සභාව විසින් ණය පදනමින් ගොවීන්ට ලබාදුන් කෘෂි පොහොර සහ කෘෂි යෙදවුම් සඳහා අයකළ යුතු රු.616,814 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය දක්වා පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී අයකිරීමට පියවර ගනු ලබන බව.	ණය අයකර ගැනීමට පියවර ගතයුතුය.
(ඕ)	වාලච්චේන ගොවිජන සේවා කාරක සභාව විසින් 2021/2022 මහා කන්නයේ ඉතිරිව පැවැති යූරියා පොහොර බඩඉරිඟු වගාවේ යෙදී සිටින ගොවීන්ට රු.2,244,021 කට විකුණා තිබූ නමුත් එම මුදල් පොහොර ලේකම් කාර්යාලයට ගෙවීමට පියවර ගෙන නොතබුණි.	කොමසාරිස්වරයාගේ උපදෙස් නොලැබීම නිසා මෙම මුදල් පොහොර ලේකම් කාර්යාලයට ආපසු ප්‍රතිපූර්ණය කර නොතිබූ බව.	නියමිත කාලය තුළ බැරකම් ගෙවා නිරවුල් කිරීමට පියවර ගතයුතුය.

(ක)	මන්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාව විසින් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ණය පදනමින් ගොවීන්ට ලබාදුන් කෘෂි පොහොර සහ කෘෂි යෙදයුම් රු.8,110,007 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගෙන නොතිබුණි.	ණය අයකිරීමට පියවර ගනු ලබන බව.	ණය අයකිරීමට පියවර ගතයුතුය.
(ග)	කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේ තිරසාර කෘෂි කළමනාකරණ සැලැස්ම යටතේ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන රු.6,210,000 ක් වූ වතුර මෝටර වාරික පදනමින් ගොවීන්ට ලබාදීම මගින් ඔවුන්ගෙන් අයකළ යුතු රු.6,009,200 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මන්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාවෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	ණය අයකිරීමට පියවර ගනු ලබන බව.	ණය අයකිරීමට පියවර ගතයුතුය.
(ච)	වෙල්ලාවෙලි ගොවිජන සේවා කාරක සභාව විසින් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ගොවීන්ට ණය පදනමින් ලබාදුන් රු.3,533,525 ක කෘෂි පොහොර සහ කෘෂි යෙදවුම් සමාලෝචිත වර්ෂය දක්වා, ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන් විසින් අයකර ගෙන නොතිබුණි.	ණය අයකිරීමට පියවර ගනු ලබන බව.	ණය අයකිරීමට පියවර ගතයුතුය.

1.3.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 5කට අදාල එකතුව රු.22,362,532 ක ශේෂයන් සනාථ කර ගැනීම සඳහා විගණනයට ඉල්ලූ සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	ණයගැති ලැයිස්තු, උප ලේඛන, සනාථ කිරීමේ ලිපි සහ විස්තරාත්මක වගු ආදිය ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව.	උප ලේඛන, සනාථ කිරීමේ ලිපි සහ විස්තරාත්මක වගු හා සියළු සාක්ෂි ඉදිරිපත් කිරීමට පියවර ගතයුතුය.

1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**			
(i)	44(1) වගන්තිය	සෑම ගොවිජන සංවිධානයකම ගිණුම් කොමසාරිස් ජනරාල් වරයා විසින් බලය පැවරූ නිලධාරියෙකු විසින් පරීක්ෂා කළයුතු බව සඳහන් වූවත්, ගොවිජන සේවා කාරක සභා 14 ක ගිණුම් විධිවිධාන ප්‍රකාරව පරීක්ෂා කර නොතිබුණි.	සෑම ගොවිජන සංවිධානයකම ගිණුම් පරීක්ෂා කිරීමට පියවර ගනු ලබන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	55(1) වගන්තිය	ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් කුඹුරු ඉඩම් මැනීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී ඉඩම් මැනීමට පියවර ගනු ලබන බව.	- එම -
(ආ)	2018 අප්‍රේල් 20 දිනැති අංක 5/2018 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් අධිකාරි බලප්‍රදේශයේ පවතින ගොඩ ඉඩම්, ගොඩ ඉඩම් නාම ලේඛනයේ ඇතුළත් කිරීමට පියවර ගෙන නොතිබුණි.	ගොඩ ඉඩම්, ගොඩ ඉඩම් නාම ලේඛනයේ ඇතුළත් කිරීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු ය.
(ඇ)	2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් පරිගනක හා පරිගනක උපාංග ලේනනගත කිරීමට ලේඛනයක් පවත්වා ගෙන යාමට පියවර ගෙන නොතිබුණි.	ලේඛනය පවත්වා ගෙන යාමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛ ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගෙන යාමට ක්‍රියාමාර්ග ගතයුතුය.
(ඈ)	1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ වූ චක්‍රලේඛයේ 107 හි 15 වගන්තිය	ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් පොදු ලේජරය සහ ජ'නල් සටහන් පවත්වා ගෙන යාමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී පොදු ලේජරය සහ ජ'නල් සටහන් පවත්වා ගෙන යාමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛ ප්‍රකාරව පොදු ලේජරය සහ ජ'නල් සටහන් පවත්වා ගෙන යාමට ක්‍රියාමාර්ග ගතයුතුය.

(ඉ)	රජයේ මුදල් චක්‍රලේඛ අංක 10/2020 හා මුදල් රෙගුලාසි 756(6)	ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් තොග අයිතමයන්ගේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වරයාට යැවීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී තොග අයිතමයන්ගේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වරයාට යැවීමට පියවර ගනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ.
(ඊ)	2006 අංක 12 වරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත	ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් රු. 25,000 කට වැඩි ගෙවීම් සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අයකර නොතිබුණි.	ඉදිරි කාලයේදී මුද්දර ගාස්තු අයකිරීමට පියවර ගනු ලබන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව මුද්දර ගාස්තු අයකිරීමට පියවර ගතයුතුය.
(උ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
(i)	මුදල් රෙගුලාසි 110	ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් හානි පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණි.	හානි පිළිබඳ ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 262(ii)	ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් ගෙවීම් වවුචර්වල "ගෙවීම් කරන ලදී" යන මුද්‍රා තබා නොතිබුණි.	ගෙවීම් බිල්පත් හා උපකාරක ලියවිලි සියල්ල"ගෙවීම් කරන ලදී" යන මුද්‍රාව තැබීමට පියවර ගනු ලබන බව.	- එම -
(iii)	මුදල් රෙගුලාසි 384	ගොවිජන සේවා කාරක සභා 13 ක් විසින් චෙක්පත් භාරගැනීම් සහ භාරයේ තබා ගැනීම් ලේඛනය පවත්වා නොතිබුණි.	ඉදිරි කාලයේදී ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන බව.	- එම -
(iv)	මුදල් රෙගුලාසි 452 (1)	ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් විගණන විමසුම් ලේඛනයක් පවත්වා ගෙන යාමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන බව.	- එම -
(v)	මුදල් රෙගුලාසි 454 (2)	ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් විදුලි සවිකිරීම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන බව.	- එම -
(vi)	මුදල් රෙගුලාසි 502 (2)	ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් ස්ථාවර	ඉදිරි කාලයේදී ලේඛන පවත්වා ගෙන යාමට	- එම -

		වත්කම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඒවා භෞතිකවද පරීක්ෂා කර නොතිබුණි.	කටයුතු කරන බව.	
(vii)	මුදල් රෙගුලාසි 880	ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් මූල්‍ය ගනුදෙනුවල නිරත නිලධාරින් ගෙන් ඇප මුදල් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි.	දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව, ක්‍රියා කිරීමට සුදුසු පියවර ගනු ලබන බව.	- එම -
(viii)	මුදල් රෙගුලාසි 891	ගොවිජන සේවා කාරක සභා 15 ක මධ්‍යස්ථාන විසින් ඇප ලේඛන පවත්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	ඇප ලේඛන පවත්වා ගෙන යාමට පියවර ගනු ලබන බව.	- එම -

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 17 ක මෙහෙයුම් ප්‍රතිඵල රු.27,149,231 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,767,326 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,381,905 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කුඹුරු ඉඩම්වල අක්කර බදු ආදායම, පොහොර විකුණුම් සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම් ආදිය වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගොවිජන බැංකු 17 ක මෙහෙයුම් ප්‍රතිඵල රු.5,523,305 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,136,839 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,386,466 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කෘෂි ණය පොලී ආදායම් ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 12 ක් පිහිටි ඉඩම්වල හිමිකාරිත්වය පවරා ගැනීමට ගොවිජන සේවා කාරක සභා විසින් විගණන දිනය වන 2024 මැයි 10 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.	ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ඉඩම් පවරා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය.
(ආ)	මන්ඩූර් ගොවිජන සේවා කාරක සභා මායිමේ ආසන්න වශයෙන් අක්කර 2,000 ක වපසරියකින් යුත් කුඹුරු ඉඩම්, මධ්‍යස්ථානයට අයත් කුඹුරු ඉඩම් ලේඛනයේ ලේඛනගත	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාදී තිබූ ඉඩම්වලින්, හිමිකාරිත්වය නොලත් පුද්ගලයින්ගේ	පනතට අනුකූලව පියවර ගතයුතුය.

	නොකිරීමෙන් එම ඉඩම්වලට අදාල අක්කර බදු මුදල් සමාලෝචිත වර්ෂය දක්වා මධ්‍යස්ථානයට අයකරගත නොහැකිව පැවැතුණි.	ඉඩම්වල ලිපිලේඛන නොමැති වීමෙන් ලේඛනගත කර නොතිබුණි.	
(ඇ)	2018 අප්‍රේල් 20 දිනැති අංක 05/2018 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව ගොඩ ඉඩම්, ගොඩ ඉඩම් ලේඛනයේ ලේඛනගත කළයුතු වුවද, වෙල්ලාවෙලි ගොවිජන සේවා කාරක සභාවේ කිසිදු ගොඩ ඉඩමක් සමාලෝචිත වර්ෂය දක්වා ලේඛනගත කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගොඩ ඉඩම් ලේඛනගත කිරිම මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	ලේඛනගත කිරීමට පියවර ගනිමින් පවතින බව.	චක්‍රලේඛ උපදෙස් පරිදි ඉඩම්, කුඹුරු ඉඩම් ලේඛනයේ ලේඛනගත කිරිමට පියවර ගතයුතුය
(ඈ)	කරඩියනාරු ගොවිජන සේවා කාරක සභාව විසින් 2020 වර්ෂයේදී රු.1,322,956 කට මිලදී ගත් යූරියා පොහොර ගොවීන්ට නොමිලයේ ලබා දී ඇති නමුත් එම මුදල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගනු ලබන බව.	මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගත යුතුය.
(ඉ)	වෙල්ලාවෙලි ගොවිජන සේවා කාරක සභාව විසින් 2007 සිට 2009 දක්වා කාල පරිච්ඡේදය තුළ ගොවීන්ට ලබාදුන් කෘෂි පොහොරවලට අදාලව ලැබිය යුතු මුදල් ලෙස රු. 415,639 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ගිණුම්ගත කර තිබුණි. එසේ වුවත්, අදාල ණය පිළිබඳව විමර්ශන සිදුකර ණය මුදල් ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන් විසින් ගොවීන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	ණය අයකිරීමට පියවර ගනු ලබන බව.	ණය අයකිරීමට පියවර ගතයුතුය.
(ඊ)	චන්දාරුමූලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් රු. 187,406 ක් වැයකර 2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් සකස්කර එය අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර අංගනය කඩා ඉවත් කර එහි නව ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. කළමනාකරණ අකාර්යක්ෂමතාව හේතුවෙන් ඉහත වියදම් සිදුවූ නමුත් අරමුණු ඉටුවී නොතිබුණි.	නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා එම ඉඩම තෝරාගෙන තිබුණු බව.	අදාල අරමුණු ඉටකර ගැනීමට පියවර ගතයුතුය.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයිත්තමලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් රු. 100,536 කට මිලදී ගත් රසායනික ද්‍රව්‍ය කල් ඉකුත් වී තිබූ නමුත්, ඒවා විනාශ කිරීමට හෝ බැහැර කිරීමට පියවර ගෙන නොතිබුණි.	කපාහැරීමට දිස්ත්‍රික් කොමසාරිස්වරයාගේ අනුමැතිය ඉල්ලා ඇති බව.	මුදල් රෙගුලාසි 102 සිට 109 ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ආ)	2009 වර්ෂයේ පැවැති අයහපත් වාතාවරණයන් හේතුවෙන් තාන්දාමලෙයි ගොවිජන සේවා කාරක සභාවේ වත්කම්වලට සිදුවූ අලාභය රු.2,086,912ක් වෙනුවෙන් පොලීසියේ පැමිණිලි කර තිබූ නමුත්, පසුගිය වර්ෂ 14 ක කාලයක් එය විසඳා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	ගැලපීමට කටයුතු කරමින් පවතින බව.	- එම -
(ඇ)	වාලච්චේන ගොවිජන සේවා කාරක සභාව විසින් 2023 වර්ෂයේ යල කන්නයේ වී වගාකිරිම සඳහා පොහොර රජයේ ආයතනවලින් මිලදී ගැනීමට පියවර නොගෙන පුද්ගලික ආයතනයකින් පොහොර මිලදී ගැනීමෙන් මධ්‍යස්ථානයට රු.500,000 ක අලාභයක් සිදුවී තිබුණි.	ඉදිරි කාලයේදී රජයේ ආයතනවලින් පොහොර මිලදී ගැනීමට පියවර ගනු ලබන බව.	රජයේ ආයතනවලින් පොහොර මිලදී ගැනීමට පියවර ගතයුතු අතර අදාල පාඩු වගකිව යුතු නිලධාරීන් අයකර ගැනිමට පියවර ගතයුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවේ ප්‍රමිති පාලන පර්යේෂණාගාරයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 115,088 ක ශුද්ධ පාඩුවක් ඇති වූ තිබූ අතර ඊට ප්‍රතිරූපීව පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභය රු. 69,053 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.184,141 ක පිරිහීමක් පැවැතුණි.	ඉදිරි කාලයේදී ලාභය වැඩි කිරීමට පියවර ගනු ලබන බව.	ලාභය වැඩිකර ගැනීමට පියවර ගතයුතුය.
(ආ)	2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව, කාත්තාන්කුඩි ගොවිජන සේවා කාරක සභාව විසින් අයකරනු ලබන කාමර කුලී ප්‍රමාණය කාලානුරූපීව තක්සේරු කර කුලී අයකිරිමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී නියමිත ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව පියවර ගතයුතුය.

(ඈ)	කොක්කඩි චෝලෙයි ගොවිජන සේවා කාරක සභාවේ 2022 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.1,428,200 ක් වටිනා කිලෝ ග්‍රෑම් 25ක් බර යූරියා පොහොර මළු 74 ක් සමාලෝචිත වර්ෂය දක්වා විකිණීමට හෝ සැපයුම්කරුට ආපසු යැවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේදී නියමිත ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව.	විකිණීමට හෝ සැපයුම්කරුට ආපසු යැවීමට ක්රියාමාර්ග ගතයුතු ය.
(ඇ)	මන්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාවට සමාලෝචිත වර්ෂයේ කොළඹ කොමර්ෂල් පොහොර ආයතනයෙන් ලැබී තිබූ කිලෝග්‍රෑම් 50 ක් බර එකක් රු.9,000 ක් වටිනා යූරියා පොහොර බෑග් 426 ක් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ තිබියදීත් සමාලෝචිත වර්ෂයේ කිලෝ ග්‍රෑම් 50 ක් බර යූරියා පොහොර මළු 1,000 ක් ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් මිලදී ගෙන විකුණා තිබුණි. ඒ අනුව කොළඹ කොමර්ෂල් පොහොර ආයතනයෙන් ලැබී තිබූ යූරියා පොහොර ගොවීන්ට විකිණීමට ප්‍රමුඛතාවය ලබා නොදීම නිසා එම පොහොර ගබඩාවේ නොවිකිණී පැවැතුණි.	මේ පිළිබඳව ක්‍රියාමාර්ග ඉදිරි කාලයේදී ගනු ලබන බව.	නිසි පරිදි නියමිත මිලට විකුණුම් සිදුකළ යුතුය.
(ඉ)	වාකරෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ඉඩම් අක්කර 10,921 කින් රු.873,705 ක අක්කර බදු මුදලක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	හිඟහිටි අක්කර බදු මුදල් අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	අක්කර බදු නියමිත පරිදි අය කිරිමට පියවර ගතයුතුය.
(ඊ)	වාකරෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවියෙකුට 2010 වර්ෂයේදී ලබාදුන් රෝද දෙකේ ට්‍රැක්ටරයකින් අයකළ යුතු රු.180,000 ක ණය සහ 2011 වර්ෂයේ ලබාදුන් කෘෂිණය රු.10,000 ක් වර්ෂ 12 කට අධික කාලයක සිට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මෙම ණය අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	ණය අයකර ගැනීමට පියවර ගතයුතුය.
(උ)	වාලච්චේනෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් 2023/2024 මහ කන්නයේ වී වගාවේදී අක්කර 02 කට වඩා අඩු කුඹුරු ඉඩම් සහිත ගොවීන්ට අක්කරයකට රු.15,000 ක් බැගින් වන පදනමින් සහනාධාර ලබාදිය යුතු විය. අක්කර 0.4 සිට 2 ක් දක්වා කුඹුරු ඉඩම් සහිත ගොවීන් 06 කට රු. 157,500 ක් ගෙවිය යුතු වුවත් ඔවුන් වෙත රු.87,000 ක සහනාධාර මුදලක් පමණක් මධ්‍යස්ථානය විසින් ලබාදී තිබුණි.	ඉදිරි කාලයේදී මෙලෙස සිදු නොවී පැවැතීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව.	අදාල ඉඩම්වල ප්‍රමාණයට සරිලන පරිදි සහනාධාර ලබාාදීමට පියවර ගතයුතුය.

3.4 අරමුදල් ඌන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිළිඳු ගොවීන්ගේ සිසු දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා ගොවිජන සංවිධාන නියෝජිතයින්ගෙන් පරිත්‍යාග ලබා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ මුදල් සහ එමගින් මේ දක්වා ඉපැයූ පොලී ආදායම ඇතුළත් එකතුව රු.2,747,911 දීර්ඝකාලයක සිට ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් කිසිදු ශිෂ්‍යත්ව පිරිනැමීමක් සිදු කිරීමෙන් තොරව අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.	අරමුදල් උපයෝජනය කිරීමට පියවර ගනු ලබන බව.	අරමුදල් අදාල අරමුණට උපයෝජනය කිරීමට පියවර ගතයුතුය.
(ආ)	හරිත නිවාස වතු සඳහා 2016 වර්ෂයේ රු.412,000 ක් බැගින් 1,236,000 ක් ගොවිජන සේවා කාරක සභා 03ක් වෙත ලබාදී තිබුණ අතර, එම ප්‍රතිපාදනවලින් රු.517,475 ක් උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවැතුණි.	ආදායම් උපයා ගැනීමට හැකි පරිදි උපයෝජනය කිරීමට පියවර ගනු ලබන බව.	ඉදිකරන ලද හරිත නිවාස වතු සහ ලැබූ මුදල් ඵලදායි ආකාරයෙන් උපයෝජනය කිරීමට පියවර ගතයුතුය.

3.5 නිෂ්කාර්ය/ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාබනික පොහොර නිෂ්පාදනය සඳහා නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් ගොවිජන සේවා කාරක සභාවලට තණකොළ කපන යන්ත්‍ර ලබාදී තිබුණද, ඒවා කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ගොවීන්ට ලබාදීමට හෝ පොහොර නිෂ්පාදනය සඳහා උපයෝජනය කිරීමට පියවර නොගෙන නිෂ්කාර්යව තිබුණි.	ආණ්ඩුකාරවරයා වෙත ආපසු යැවීමට පියවර ගෙන ඇති බව.	වත්කම් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගතයුතුය.
(ආ)	2016 සහ 2017 වර්ෂවලදී ගොවිජන සේවා කාරක සභා 09 කට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ රු.2,989,751 ක් මූල්‍ය ප්‍රතිපාදන වැයකර හරිත නිවාස ඉදිකර තිබුණද, මේවා කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි.	එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු හා ආදායම් උපයා ගැනීමට නොහැකිව පැවැති බව.	හරිත නිවාස භාවිතා කර නිෂ්පාදන කටයුතු සිදු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය.
(ඇ)	මන්ඩපත්තඩි ගොවිජන සේවා කාරක සභාවට අයත් ඩෝසර් යන්ත්‍රය 2013 වර්ෂයේ සිට ක්‍රියාවිරහිත වී පැවැති අතර එම යන්ත්‍රයෙන්	එම යන්ත්‍රය අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතී. එසේම, එය පශු සම්පත්	එම ඩෝසර් යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට හෝ ඵලදායීව

	කිසිදු ආදායමක් 2013 වර්ෂයේ සිට උපයාගෙන නොතිබුණි. එසේම, 2013 සිට 2018 දක්වා කාලපරිච්ඡේදයේ එම යන්ත්‍රය සඳහා රු.6,000,000 ක් ක්ෂය කර තිබුණි.	සංවර්ධන මණ්ඩලයට මාරුකිරීම සඳහා කොමසාරිස් ජනරාල් වරයාගේ අනුමැතිය ලබාගැනීමේ ලිපිය යවා ඇති බව.	උපයෝජනය කිරීම සඳහා විධිමත් අනුමැතිය යටතේ වෙනත් ආයතනයකට භාරදීමට පියවර ගතයුතුය.
(ඇ)	කරඩියනාරු ගොවිජන සේවා කාරක සභාවේ ඉදිකර තිබූ විකුණුම් මධ්‍යස්ථාන ගොඩනැගිලි සංකීර්ණය සමාලෝචිත වර්ෂය දක්වා අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.	අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගනු ලබන බව.	අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගතයුතුය.
(ඉ)	කල්ලඩි ගොවිජන සේවා කාරක සභාවට පස් පරීක්ෂා කිරිමේ ප්‍රමිති පාලන පර්යේෂණාගාර උපකරණ 2020 වර්ෂයේදී භාරදී තිබූ නමුත්, එය භාවිතා කර කෘෂි ඉඩම්වල පස් පරීක්ෂණයන් සිදුකිරීමට සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් පියවර ගෙන නොතිබුණි.	පස් පරීක්ෂණයන් සිදුකිරීමට පියවර ගනු ලබන බව.	උපකරණ අදාල අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගතයුතුය.

3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) සහ (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව, ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලබන බව.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට පියවර ගතයුතුය.
(ආ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) සහ (ආ) මාර්ගෝපදේශ අනුගමනය නොකර ගොවිජන සේවා කාරක සභා 3ක් විසින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.20,298,408 ක මිලදී ගැනුම් සිදු කර තිබුණි.	ඉදිරි කාලයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකිරිමට උපදෙස් ලබාදී ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය.
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් සමාලෝචිත වර්ෂයේ එකතුව රු.22,488,240 ක මිලදී ගැනුම් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව සිදු කර තිබුණි.	ඉදිරි කාලයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකිරිමට උපදෙස් ලබාදී ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය.

3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ පළුගාමම් ගොවිජන සේවා කාරක සභාව විසින් ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සඳහා රු.290,758 ක පිරිවැයකට ගොවිජන සංවිධානයක් වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණද, එම කාර්යය ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව ගොවි සංවිධානය විසින් උපකොන්ත්‍රාත් ලබාදී ඉටුකර තිබුණි. එසේම, කොන්ත්‍රාත්තුවට අදාළ මුදල් බැංකුවෙන් ආපසු ලබාගැනීම සඳහා ගොවිජන සංවිධානයේ සාමාජිකයින්ගේ අනුමැතියකින් තොරව, ගොවිජන සංවර්ධන නිලධාරී සහ ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් අනුමැතිය ලබාදී තිබුණි.	ඉදිරි කාලයේදී ගොවිජන සංවිධානවලට පමණක් කොන්ත්‍රාත් ලබාදීමට පියවර ගනු ලබන බව.	ගිවිසුම්ගත පරිදි කොන්ත්රාත් කාර්යයන් ගොවිජන සංවිධාන මාර්ගයෙන් සිදුකර ගැනීමට පියවර ගතයුතුය.

3.8 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 09 ක වර්ෂ 05 සිට 10 කට අධික කාලයක් අඛණ්ඩව එකම ස්ථානයක සේවය කරන නිලධාරීන් 37 ක් ස්ථාන මාරු කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මධ්‍යස්ථානයේ සේවය කරන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව තීරණ ගනු ලබයි. මේ වන විට දිස්ත්‍රික් කාර්යාලය විසින් ස්ථාන මාරුකිරීම් කටයුතු සිදුකරනු ලබන බව.	ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව නිලධාරීන් ස්ථාන මාරු කිරීමට පියවර ගතයුතුය.

4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා 17 ක් විසින් ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂයේ ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කිරීමට පියවර ගනු ලබන බව.	පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

5. ගොවිජන බැංකු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන බැංකු 06ක් විසින් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල ගොවීන් වෙත ලබා දුන් ණය මුදල් අතරින් ගොවීන් 222 කට ලබාදුන් එකතුව රු.13,691,762 ක් වූ හිඟ ණය, පොලී සහ දඩ පොලී සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර නොතිබුණි.	අයකර ගැනීමට පියවර ගනු ලබන බව.	ණය නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගතයුතු වේ.
(ආ)	2019 ඔක්තෝබර් 22 දිනැති අංක 7/12/5/4 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව, බාහිර ආයතනවල ක්‍රියාත්මක කරන කෘෂි සංවිධානවල අරමුදල්, ගොවිජන බැංකුවේ තැන්පත් කරන ලෙස උපදෙස් ලබාදී තිබූ නමුත්, ගොවිජන සංවිධානවල පවතින බැංකු ශේෂ ගොවිජන බැංකු 17 හි බැංකු ගිණුම්වල තැන්පත් කිරීමට පියවර ගෙන නොතිබුණි.	මේ පිළිබඳව ගොවිජන සංවිධාන, දැනුවත් කිරීම් සිදුකර අරමුදල් ගොවිජන බැංකුවේ තැන්පත් කිරීමට පියවර ගනු ලබන බව.	ලිපියේ උපදෙස් ප්‍රකාරව ක්‍රියා කිරීමට වැඩ පිළිවෙලක් සැකසිය යුතුය.
(ඇ)	2012 පෙබරවාරි 21 දිනැති අංක 04/2012 (ගො.බැං.) දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.2 (iii) ප්‍රකාරව, අයදුම්කරු ලබාගැනීමට අපේක්ෂිත ණය මුදලින් අවම වශයෙන් සියයට 10 ක් ගොවිජන බැංකුවේ කණ්ඩායම් ඉතිරි කිරීම් පවත්වාගෙන යායුතුය. එසේ වුවත්, සියයට 10 ක ඉතුරුම් නොමැති ගොවීන් 31 කට සුළු කණ්ඩායම් මාර්ගයෙන් කළුවාංචිකුඩි ගොවිජන බැංකුව විසින් රු.50,000 ක් බැගින් සමාලෝචිත වර්ෂයේ රු.1,550,000 ක කෘෂි ණය ලබාදී තිබුණි.	ඉදිරි කාලයේදී චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛයට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමත් ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.
(ඈ)	ගොවිජන බැංකු පිළිබඳ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛයේ 3,4,6 ප්‍රකාරව, ගොවිජන බැංකුව විසින් එහි කොටස්කරුවන් 19 කට පමණක් රු. 1,350,000 ක් ගොවිණය ලබාදී තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කරඩියනාරු ගොවිජන බැංකු මූල්‍ය චක්‍රයේ නිෂ්කාර්යව පවතින රු.4,588,957 ක් වෙනත් කොටස්කරුවන්ට ණය ලබා දීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි වර්ෂවල ගොවීන්ට වැඩිදුර පැහැදිලි කිරීම්, දැනුවත් කිරීම්, ලබාදීමෙන් ගොවිජන බැංකුවේ ණය ලබාගන්නා කොටස්කරුවන්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

(ඉ)	2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 (ගො. බැං.) දරන ගොවිජන බැංකු කළමනාකරණ, මූල්‍ය පාලන සහ වාර්තා කිරීමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.3 (i හා ii) ප්‍රකාරව, ණය අයදුම්කරු අපේක්ෂිත ණය මුදලින්, සියයට 10 ක වටිනාකමක්වූ කොටස් මුදල් ලබාගත යුතු අතර, සියයට 25 ක් ඉතිරි කිරීමක් ලෙස ඔහුගේ නමින් පවත්වාගෙන යා යුතුවේ. එසේ වූවත්, සමාලෝචිත වර්ෂයේ සියයට 25 ක ඉතිරි කිරිමේ මුදල් නොමැති කොටස්කරුවන් 149 කට රු.6,625,000 ක් කෘෂිණය පළුගාමම් ගොවිජන බැංකුව විසින් ලබාදී තිබුණි.	ඉදිරි කාලයේදී නියමිත පරිදි ණය ලබාදීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කෘෂි ණය ලබාදීමට පියවර ගතයුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ “සිතමු” වැඩසටහන යටතේ ගොඩ ඉඩම් වගාකරුවන් 35කට තාන්දාමලෙයි ගොවිජන බැංකුව විසින් රු.4,035,000 ක් ණය ලබාදී තිබුණි. එම ගොවීන් 35කට පමණක් වර්ෂ 05කට අධික කාලයක් අඛණ්ඩව කර්මාන්ත ව්‍යවසායකත්ව ණය ලබා දීම හේතුවෙන් නව ව්යවසායකයින් හඳුනාගෙන එම ණය පහසුකම් ඔවුන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි කාලයේදී නව ව්‍යවසායකයින් එකතු කර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගනු ලබන බව.	නව ව්‍යවසායකයින් එකතු කර ගැනීමට පියවර ගතයුතුය.

6. පද්ධති හා පාලන

විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මධ්‍යස්ථානයට අදාල සුළු වියදම් සියල්ල ප්‍රධාන මුදල් පොත මගින් සිදුකිරීම, මධ්‍යස්ථාන යේ දෛනිකව රැස්කරන විවිධ ආදායම් සහ විකුණුම්වලින් එන මුදලින් දෛනික කෙරෙන සුළු වියදම්වලින් පසුව ඉතිරි මුදලින් ප්‍රමාණවත් මුදලක් අතැති මුදලක් ලෙස පවත්වා ඉතිරි මුදල් බැංකුවේ ජංගම ගිණුමේ තැන්පත් කිරීම වැනි කාරණා සම්බන්ධයෙන් සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ගොවිජන සේවා කාරක සභා 15ක් විසින් පියවර ගෙන නොතිබුණි.	සුළු වියදම් සුළු මුදල් පොත මගින් සිදුකිරීමට පියවර ගෙන ඇති බව.	සුළු වියදම් සුළු මුදල් පොත මගින් සිදුකිරීමට හා අතැති මුදල් බැංකුගත කිරීමට පියවර ගතයුතු වේ.